**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය - 2017**

----------------------------------------------------------

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතේ 17(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය ව්‍යාචනය**

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සුදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද, ඊට අනුකූල නොවන ලෙස මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරන බව ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා අධිකාරිය වෙත වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ අධිකාරිය විසින් දේපළ පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය අනුව, ක්ෂය කරන බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති පිරිවැය රු.52,345,094 ක වත්කම් ලියාහල අගයට (WDV) ක්ෂය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.10,354,455 කින් ඌන ගණනය වී තිබුණි.

(ඈ) අධිකාරිය විසින් ජංගම නොවන වත්කම් වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 05 ඉක්ම වූ කිසිදු වත්කමක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අඟුලාන හා හලාවත නිවාස ව්‍යාපෘතිය සඳහා රු.9,653,072 ක් ගෙවා අධිකාරිය විසින් අත්පත් කර ගෙන තිබූ ඉඩම් හෙක්ටයාර් 2.43 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් යටතේ දැක්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) අධිකාරිය විසින් විකුණුම් පදනම මත බැහැර කිරීමට අපේක්ෂිත නිවාස යෝජනා ක්‍රම 04 කට අයත් රු.206,299,127 ක් වටිනා නිවාස 124 ක් ජංගම වත්කම් යටතේ තොග ලෙස දැක්වීම වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ නිවාස ව්‍යාපෘති ලෙස දක්වා තිබුණි.

(ඇ) අනුරාධපුර තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීමට රේඛීය අමාත්‍යාංශයෙන් ඉකුත් වර්ෂයේදී අධිකාරියට ලැබී තිබුණු රු.58,594,358 ක් ප්‍රදාන යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට ආදායම් සංචිත යටතේ දක්වා තිබුණි.

(ඈ) නැවත අයකර ගැනීමේ පදනම මත නිලධාරීන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබා දී තිබූ ණය මුදල රු.383,625 ක් වියදම් ලෙස ගිණුම් ගතකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලැබී තිබූ ණය වාරික වටිනාකම් රු.164,061 ක් පුහුණු වියදමෙන් අඩුකර දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පුහුණු වියදම රු.164,061 කින් අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ලැබිය යුතු රු.159,403 ක ණය ශේෂයද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අයත්ව තිබුණු ජීප් රථයක් 2016 දෙසැම්බර් 21 දින අධිකාරිය වෙත පවරාගෙන තිබුණ ද එය තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ) අනුරාධපුර "තුරුඉතුරුගම හරිත ජනාවාස ව්‍යාපෘතියෙහි" නිවාස 99 ක් 2013 වර්ෂයේදී නිවාසලාභීන් වෙත ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිවාස 32 ක නිවාසලාභින්ගෙන් ලැබිය යුතු වාරික ආදායම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට වසර 1 ත් වසර 3 ත් අතර අයනොවී පවතින රු.36,731,157 ක ණය ශේෂයක් පැවතියද එම ණය සමාලෝචනය කර ප්‍රමාණවත් පරිදි අඩමාණ ණය වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබී තිබූ නිවාස ක්‍රම 03 කින් රු.මිලියන 2.67 ක ණය වාරික අයකර ගිණුම් ගතකර තිබුණද එම වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකිරීමට කටයුතුකර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්
---------------------------------
නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස 2017 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ රු.207,331,767 ක් දක්වා තිබුණද ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම වටිනාකම සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි වූ අතර නාගරික සංවර්ධන අධිකාරියේ 2016 විගණිත මූල්‍ය ප්‍රකාශන අනුවද එවැනි ශේෂයක් ගෙවිය යුතු ලෙස දක්වා නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්
------------------------------
සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව, අය විය යුතු ආපදා ණය ශේෂය රු.12,835,371 ක් වුවද උපලේඛන අනුව එම වටිනාකම රු. 12,879,234 ක් වුයෙන් රු.43,863 ක පැහැදිලි නොකල වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විසිරි නිවාස ණය වැඩසටහනෙහි පළමු අදියර යටතේ ලැබිය යුතු ණය වාරික වටිනාකම රු.23,986,390 ක් වූ අතර එයින් වසර 1 ත් වසර 2 ත් අතර ශේෂය රු.14,711,505 ක් ද වසර 2 ට වැඩි ශේෂය රු. 9,274,885 ක් ද විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතුව පවතින අඟුලාන නිවාස කුලී ආදායම රු.10,909,488 ක් වුවද වර්ෂය තුළදී අයකර ගත් කුලී ආදායම රු.407,100 ක් වූයෙන් මුළු කුලී ආදායමෙන් සියයට 96 ක් අයවිය යුතුව පැවතුණි.

(ඇ) තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ විකුණුම් පදනම මත ලබා දුන් නිවාස 25 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.672,939 ක් අයවිය යුතු වුවද රු.125,225 ක් පමණක් අයවී තිබූ අතර අයවී නොතිබූ වාරිකවල වටිනාකම සියයට 81 ක් විය. එමෙන්ම, පුනස්ථාපන පදනම මත ලබාදුන් නිවාස 72 ක් සඳහා රු.1,135,512 ක් අයවිය යුතු වුවද රු.167,640 ක් පමණක් අයවී තිබූ අතර සියයට 86 ක ණය ශේෂයක් අයවී නොතිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරියේ එකඟතාවයකින් තොරව අධිකාරියේ කළමනාකරණ තීරණයක් මත නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු කාර්යාල කුලිය ගෙවීම අත්හිටුවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කුලිය රු.21,129,684 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානය වනවිට අධිකාරිය විසින් ප්‍රජා මූල සමිති වෙත ගෙවිය යුතු රු.11,823,000 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට අය නොවී පවතින හිඟ ආපදා ණය ශේෂය රු.385,739 ක් වූ අතර ඉන් වර්ෂ 01 ත් 05 ත් අතර වටිනාකම රු.250,379 ක් විය.

(උ) සිංහපුර නිවාස ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කුලී ආදායම රු.1,557,000 ක් වූ අතර ඉන් වර්ෂ 02 ත් 05 ත් අතර අයනොවී පැවති ශේෂය රු.707,000 ක් හෙවත් මුළු කුලී ආදායමෙන් සියයට 45 ක් විය.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රඳවාගැනීම් (Retention) මුදල්වල එකතුව රු.1,299,416 ක් වූ අතර ඉන් වර්ෂ 1 ත් 5 ත් අතර පැවති ශේෂය රු.1,106,284 ක් වර්ෂ 5 ඉක්ම වූ ශේෂය රු.110,561 ක් වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත | (i) නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබූ නමුත් අධිකාරිය පිහිටුවා වර්ෂ 9 ක් ගතවී තිබුණ ද ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.<br><br>(ii) පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් සභාපතිවරයකු ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් වනවිට පත් කර තිබුණද පනතේ ප්‍රකාරව එම කමිටුව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණු වලට අදාල කාර්යයන් හඳුනාගෙන නොතිබුණි.<br><br>(iii) පනතේ 16 (3) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද 2017 වර්ෂය අවසානය වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් ඒකාබද්ධ අරමුදලින් ලබාදී නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1982 අංක 45 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (සංශෝධන) පනත 20 (ඌ) උප වගන්තිය | අඟුලාන නිවාස ව්‍යාපෘතිය ජනතා අයිතියට පැවරීමට සමගාමීව නිවාස ව්‍යාපෘතියේ කළමනාකරණ කටයුතු සඳහා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවත් මෙම වාර්තාවේ දින වන විටත් එම කමිටු පිහිටුවීමට කටයුතු කර, නොතිබුණි. මෙම කළමනාකරණ කමිටු පිහිටුවීම වෙනුවෙන් නිවාසලාභීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.12,621,560 ක් අයකර අධිකාරියේ ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබූ නමුත් එම කමිටු පිහිටුවීමට කටයුතු නොකිරීම හේතුවෙන් නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,203,520 ක් අධිකාරියේ අරමුදලින් දැරීමට සිදු වී තිබුණි. |
| (ඇ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා ගන්නා නිලධාරියා විසින් එම කාර්ය නිම කළ විගසම අග්‍රිමය පියවිය යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුලි දක්වා වූ කාලය තුළ නිලධාරීන් දෙදෙනෙකු වෙත අවස්ථා 4 කදී ලබා දී තිබූ රු.385,000 ක අතුරු අග්‍රිම මෙම වාර්තාවේ දින වන විටත් පියවා නොතිබූ අතර අවස්ථා 23 කදී නිලධාරීන් 15 දෙනෙකු වෙත ලබාදී තිබූ රු.641,180 ක අතුරු අග්‍රිම පියවීමට දින 27 සිට දින 103 ක් දක්වා වූ කාලයක් ගත වී තිබුණි.<br><br>(ii) මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැකි අතර එම සීමාවන් ඉක්මවීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබාගත යුතුය. එහෙත්, ඊට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂය තුළ මාණ්ඩලික නොවන නිලධාරියෙකු වෙත අවස්ථා දෙකකදී රු.350,000 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ඈ) 2017 දෙසැම්බර් 11 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ එකඟතාවයකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සේවකයකු වෙනුවෙන් රු.15,000 බැගින් සමාලෝචිත වර්ෂය සඳහා රු.1,507,500 ක දිරි දීමනා ගෙවා තිබුණි. |
| (ඉ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 වගන්තිය | රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හිදී, නිසි අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව දරන ලද සත්‍ය ඉන්ධන වියදම ප්‍රතිපූරණය කළ හැකි වුවද, එකී අනුමැතීන් ලබා ගැනීමට ප්‍රථම, අතිරේක ඉන්ධන භාවිතා කර එම මාසය අවසානයේදී අදාල අනුමැතීන් සඳහා යොමු කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 වන වගන්තිය | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද භාණ්ඩවලට අදාලව ලැබී තිබූ රු.3,985,025 ක් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව, ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. තවද අපහරණ කටයුතු නිම කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කළයුතු සවිස්තරාත්මක වාර්තාව විගණකාධිපති පිටපතක් සහිතව මහා භාණ්ඩාගාරයේ අදාළ අංශ වෙත යොමු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,844,291 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.46,536,014 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.26,691,723 කින් අඩුවී තිබුණි. අයභාර වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන රු.20,464,450 කින් වැඩිවීම ඉහත ඌනතාවය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013,2014 වර්ෂවලදී පිළිවෙලින් රු.6,032,874 ක අතිරික්තයක් හා රු.10,284,600 ක ඌනතාවයක් ඇති වී තිබූ අතර 2015 වර්ෂයේදී රු.207,344,767 ක අතිරික්තයක් ඇති වී තිබුණි. එහෙත්, 2016 හා සමාලෝචිත වර්ෂයේදී ඌනතාවයක් ඇති වී තිබූ අතර එය රු.46,536,014 සිට රු.19,844,291 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී, 2013 වර්ෂයේදී රු.53,501,687 ක් වූ අධිකාරියේ දායකත්වය සමාලෝචිත වර්ෂය දක්වාම ධන අගයක් ගෙන තිබූ නමුත් එය වාර්ෂිකව උච්චාවචනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු. 53,058,777 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

----------------

#### 4.1.1 සැලසුම් කිරීම

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව ආයතනයේ වර්තමානයේ පවතින සම්පත්, පසුගිය වසර තුනක මෙහෙයුම් ප්‍රතිඵලවල සමාලෝචනයක් ඒ ඒ කාර්යන් සඳහා වගකීම පැවරී ඇති නිළධාරීන් යනාදී තොරතුරු ඇතුළත් කර සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතට අනුව අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(i) රජය හා පළාත් පාලන ආයතන සතු ඉඩම් අධිකාරියේ කටයුතු වෙනුවෙන් අත්පත් කර ගැනීම.

(ii) නාගරික ජනාවාසවල ජීවන තත්ත්වය නගා සිටුවීමට අදාල යෝජනා, සැලසුම් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(iii) නාගරික පදිංචිකරුවන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය හඳුනාගැනීමට අදාල වන සමීක්ෂණ හා අධ්‍යයන කටයුතු පැවැත්වීම.

(iv) ජාතික වශයෙන් අදාලවන නාගරික නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලසුම තුළ ඇතුළත් ක්‍රියාකාරකම්වලින් ඉටුකර ගත යුතු ප්‍රමාණයන්, ඒ ඒ කාර්යයන් සඳහා වගකීම පැවරී ඇති නිළධාරීන් සහ කාර්යසාධන ඇගයීම සඳහා වන දර්ශකයන් (Indicators) ඉදිරිපත් කර නොතිබුණු අතර භාණ්ඩාගාර ප්‍රදාන මත ඉටුකළ යුතු ක්‍රියාකාරකම් පමණක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-----------------------------------------

තිරසාර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇති වන බවට සහතික වීම පිණිස දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම මගින් හෝ වඩාත් පහසු නිවාස පහසුකම් හා අවම නාගරික පහසුකම් සඳහා සුදුසු ප්‍රදේශය සැලසීම මගින් සේවා පහසුකම් අඩු නාගරික ජනාවාසවල වෙසෙන තැනැත්තන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අරමුණු වේ.

අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සහ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලුනාව නිවාස ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 90 ක් වැයකොට සම්පූර්ණයෙන්ම නිම කිරීමට සැළසුම් කර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 60 ක් පමණක් වැයකර තිබු අතර ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණයෙන්ම නිමකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී හොරණ නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 34 ක් වැය කොට සියයට 75 ක වැඩ නිම කිරීමට සැළසුම් කර තිබුණ ද රු.මිලියන 6.29 ක් පමණක් වැයකර තිබූ අතර ලඟා කරගත් භෞතික ප්‍රගතිය සියයට 12 ක් විය. තවද, මෙම ව්‍යාපෘතියේ කටයුතුවලදී සිදුව තිබූ රු.668,200 ක පමණ මූල්‍ය අක්‍රමිකතා හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු රේඛීය අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබූ අතර සිදුවූ අක්‍රමිකතා සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට 2018 ජූනි වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) ගාල්ල, රජගම නාගරික නිවාස ව්‍යාපෘතිය යටතේ පවුල් 137 ක නිවාස සංවර්ධනය කිරීමේ වැඩසටහනෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 63.20 ක් වැයකොට සියයට 95 ක් නිම කිරීමට සැළසුම්කර තිබුණද ලඟා කරගත් භෞතික ප්‍රගතිය සියයට 83 ක් වූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද වියදම රු. මිලියන 52.65 ක් විය.

(ඈ) අගුලාන සයුරුපුර නිවාස ව්‍යාපෘතියේ වෙළඳ සංකීර්ණය සහ කසළ බැහැරකරන ස්ථානය ඉදිකිරීම සඳහා වූ රු.මිලියන 17.21 ක්වූ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත කාලය 2016 සැප්තැම්බර් 27 දින වන විට අවසන්ව තිබූ නමුත් 2018 ජූනි වන විටත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට හෝ ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම මුල් ප්‍රමාණ පත්‍රයේ ඇතුළත්ව තිබූ රු.මිලියන 2.82 ක කසල බැහැර කරන ස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, ප්‍රමාණ පත්‍ර නැවත සංශෝධනයකදී ඉවත් කර තිබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය. තවද, ප්‍රමාණ පත්‍ර සංශෝධනයක් හා කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 18.77 දක්වා වැඩි වී තිබුණද කොන්ත්‍රාත්කරු සමග නව ගිවිසුමකට එළඹීමටද අධිකාරිය කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් ඉදිකරන ලද හා ඉදිකරමින් පවතින නිවාස යෝජනා ක්‍රම 05 ක පවතින නිවාස ඒකක 863 කට අදාල හෙක්ටයාර 12.32 ක ඉඩම් විවිධ ආයතනවලින් පවරා ගැනීමට 2011 වර්ෂයේ සිට කටයුතු කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉඩම් පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි. එම හේතුවෙන් නිවාසලාභීන්ට ඉඩම් ඔප්පු ලබාදීමේ ප්‍රමාදයන් සිදුවී තිබූ බව විගණනයේදී වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර ප්‍රදාන මගින් රු.මිලියන 1,172 ක් වැයකර ලුනාව නිවාස යෝජනා ක්‍රමය වෙනුවෙන් නිවාස ඒකක 380 ක් ඉදිකර තිබුණද 2012 මාර්තු 22 දින විෂයභාර අමාත්‍යවරයා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3 වන වගන්තිය පරිදි එම නිවාස වල පදිංචි කිරීමට මොරටුව මහ නගර සභා සීමාවේ පදිංචි අඩු පහසුකම් නාගරික ජනාවාස පවුල් 356 ක් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නාගරික අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා වැසිකිළි සාදා නිම කිරීමට එක් වැසිකිළියකට රු. 17,189 ක ද්‍රව්‍යමය ආධාර සහ රු.10,000 ක මූල්‍යමය ආධාර වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 17.50 ක් වැයකර තිබුණි. වැසිකිළි ඉදිකිරීම් සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවුල් 814 ක් පමණක් තෝරා ගෙන තිබූ නමුත් එම දිස්ත්‍රික්කය තෝරා ගත් පදනම විගණනයේදී අනාවරණය නොවුණි. තවද, අධිකාරිය හා ප්‍රතිලාභීන් අතර වූ ගිවිසුම අනුව, මාසයක් තුළ වැසිකිළිය සාදා නිම කළ යුතු අතර එලෙස වැසිකිළි සම්පූර්ණයෙන්ම නිමවා නොමැති පවුල් 380 ක් සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ සේවයෙන් ඉවත් වූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.1,059,513 ක ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ සිට බැංකු සැසඳුම් ප්‍රකාශනයක දක්වා තිබූ රු.116,500 ක බැරකම් 02 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව අධ්‍යයන කටයුතු සඳහා නිලධාරියෙකුට රු.256,000 ක ණය මුදලක් ලබා දී තිබුණි.

(උ) 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 14/1293/517/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අධිකාරිය පිහිට වූ වහාම සීමාසහිත රීල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම මාස දෙකක් ඇතුළත ඈවර කර එම සමාගමේ වත්කම් හා වගකීම් අධිකාරිය වෙත පවරා ගතයුතු බව දන්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රු.7,929,972 ක මෝටර් වාහන 5 ක් පමණක් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර එදිනට ඉතිරිව පැවති රු.12,499,801 ක වත්කම් හා රු.16,038,231 ක වගකීම් සහ රු.3,880,025 ක බැංකු ශේෂ කිසිවක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2015 ඔක්තෝබර් 12 දින සමාගමේ බාහිර පාර්ශවකරුවන් 26 දෙනෙකු වෙනුවෙන් ගෙවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාදී තිබූ රු.19,024,421 කින් 2015 ඔක්තෝබර් මාසයේදී බාහිර පාර්ශවකරුවන් 24 දෙනෙකු වෙත ගෙවීම සඳහා අධිකාරිය විසින් නිකුත් කල රු.7,139,255 ක චෙක්පත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් වසර 2 කට අධික කාලයක සිට පාර්ශවකරුවන් වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණි

(ඖ) 2015 ජුනි 12 දිනැති අංක 03/2015/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, හලාවත නිවාස ව්‍යාපෘතියෙහි නිවාසලාභීන්ගෙන් එක් නිවසකට රු.915,148 ක් බැගින් අයකර ගැනීමට තීරණය කර තිබුණි. එහෙත් එම නිවාසවල ඉදිකිරීමේ ප්‍රමිතිය පහළ තත්ත්වයක පැවතීම මත 2017 දෙසැම්බර් 18 දිනැති අංක 11/2017/24 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව එක් නිවසකින් අය කරන මුදල රු.700,000 ක් දක්වා අඩුකර තිබූ අතර ඒ අනුව අධිකාරියට සිදුවූ පාඩුව රු.12,263,436 ක් විය. තවද, මෙම නිවාස ව්‍යාපෘතියෙහි නිවාස 57 ක් නිවාසලාභීන්ට ලබා දීමට පෙර තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නිවාස තක්සේරු කරගෙන නොතිබුණි.

(එ) භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ඉදිකර තිබූ අඟුලාන නිවාස ව්‍යාපෘතිය සඳහා වැයකර තිබූ රු.1,179,062,714 ක් අතුරින් 2015 වර්ෂයේදී ලාභයට එරෙහිව රු.700,074,056 ක් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත කපා හැරීම සිදුකර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විසිරි ණය වැඩසටහන යටතේ ණය එකතු කිරීම දිරිගැන්වීම සඳහා සියයට 10 ක කොමිස් මුදල් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.1,051,711 ක් අධිකාරිය විසින් ණය එකතු කරන්නන්ට ගෙවා තිබුණ ද අඟුලාන නිවාස ණය සහ දිරිය නිවාස ණය පළමු අදියර වැඩසටහන්හි ණය අයකර ගැනීමේ ප්‍රගතිය පිළිවෙළින් සියයට 4 ක සහ සියයට 45 ක පහළ අගයක් ගෙන තිබුණි.

(ආ) අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේදී අනුරාධපුර "තුරුඉතුරුගම" හා හලාවත නිවාස ව්‍යාපෘති යටතේ නිවාස ලබාදී තිබූ නිවාසලාභීන් 59 දෙනෙකු සමඟ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විකුණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් අඟුලාන නිවාස ක්‍රමයට අයත් රු.මිලියන 25.60 ක් වටිනා නිවාස ඒකක 08 ක් සමාලෝචිත වර්ෂයේදී මුදල් අයකිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් බැහැර කර තිබුණද ඒ වෙනුවෙන් මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හම්බන්තොට නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් නිවාසලාභීන් වෙත ලබා දී තිබූ ණය මුදල රු.3,656,154 ක් වූ අතර එම ණය මුදලට අදාල පොලිය භාණ්ඩාගාරයේ හෝ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත අයනොකිරීමට තීරණය කර තිබුණි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අධිකාරියේ අරමුදල්වලින් පොලිය වශයෙන් රු.1,965,468 ක් වැය කර තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නාගරික ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභීන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා නිවාස ව්‍යාපෘති 03 ක් සහ විසිරි නිවාස ණය ලබාදීම වෙනුවෙන් රු.මිලියන 775.06 ක් මහා භාණ්ඩාගාරය මගින් අධිකාරිය වෙත ලබා දී තිබූ අතර ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට අපේක්ෂිත වාරික වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 410.40 ක් විය. මෙයින් රු.මිලියන 8.53 ක් අය වී තිබුණ ද එම මුදල් 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ පනතේ 16 වගන්තිය පරිදි අධිකාරියේ අරමුදලකට බැර නොකර අධිකාරියේ අයහාර වියදම් වෙනුවෙන් වැය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී මානව සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් ලැබී තිබුණු රු.මිලියන 20 ක් අතුරින් රු. මිලියන 5.17 ක් එම වැඩසටහනට ඇතුළත් නොවූ ලෝක ජනාවාස දින වැඩසටහන වෙනුවෙන් වියදම් කර තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සතු සිංහපුර, අනුරාධපුර හා අඟුලාන ප්‍රදේශවල පැවති නිවාස ක්‍රම 03 ක පවතින නිවාස 48 ක් වසර 1 ත් වසර 3 ත් අතර කාලයක් භාවිතයට නොගෙන වසා දමා තිබීම හේතුවෙන් අධිකාරියට රැස්කර ගත හැකිව තිබූ කුලී ආදායම අහිමිවී තිබුණි.

(ආ) සමාජ සජීවිකරණ වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී සහ 2016 වර්ෂයේදී රු.2,662,065 ක් වැයකර මිලදී ගෙන තිබූ ජුකී මහන මැෂින් 8 ක් හා සාමාන්‍ය මහන මැෂින් 110 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදාදීමට කටයුතු කර නොතිබුණි.

**4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්**

---------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත නිලධාරීන් සිව් දෙනෙකු මුදාහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් ඒ සඳහා වැටුප් ලෙස රු.1,888,797 ක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,615,208 ක් ප්‍රතිපූර්ණය කරගත යුතුව පැවතුණි.

**4.7 කාර්යමණ්ඩල පරිපාලනය**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ඉංජිනේරු තනතුරු 02 ක් අනුමත කර තිබුණ ද 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම තනතුරු පුරප්පාඩුව පවතින බැවින් අධිකාරියේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම කෙරෙහි අහිතකර තත්ත්වයක් උද්ගත වී තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව, නිලධාරීන් 21 දෙනෙකු අධිකාරියට බඳවාගෙන තිබුණද එම තනතුරු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඇ) රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ නිවාස අධීක්ෂණ කටයුතු වෙනුවෙන් අභ්‍යාසලාභීන් (පුහුණු) 21 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.2,792,250 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනයන් සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) ඡේදය ප්‍රකාරව ඉදිකිරීම් ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කිරීමට පෙර, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ඉදිකිරීමට අදාළ ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව සහ ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කරුණු ඉටුකර තිබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,233,367,544 ක් වැය කර ඉදිකර තිබූ ලුනාව නිවාස ව්‍යාපෘතියට සහ රු.63,070,626 ක් වැයකර ඉදිකර තිබූ තලවකැලේ ලිඳුල නිවාස ව්‍යාපෘතියට අයත් ඉඩම්වල අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.6 වගන්තිය සහ 2016 ජනවාරි 25 දිනැති 29 වැනි අතිරේකය ප්‍රකාරව ඉදිකිරීම්වැඩ කොන්ත්‍රාත් සඳහා කොන්ත්‍රාත්කරුවකුට ගෙවීම් කිරීමේදී ඉදිකිරීමේ දෝෂ ආවරණය කරගැනීම සඳහා රඳවා ගැනීම් මුදලක් (Retention) අඩුකර ගෙවීම් කළ යුතු වුවද, ලුනාව නිවාස ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වෙත සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.42,298,416 කට අදාල අතුරු ගෙවීම්වලින් රැඳවුම් මුදල් අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 හා 2016 ජනාවරි 25 දිනැති අතිරේඛ (supplement) 29 අනුව, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වෙනුවෙන් අඩුකර ගන්නා ලද රැඳවුම් මුදලින් (retention) සියයට 50 ක් වැඩ අවසන්කර භාරදුන් පසුව හා ඉතිරි සියයට 50 දෝෂ වගකීම් කාලය අවසන් වූ පසුව කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කළ හැකි වුවත් ඊට පටහැනිව කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කර අධිකාරිය වෙත භාරදී නොතිබුණු, ලුනාව නිවාස ව්‍යාපෘතියට අදාළව රඳවාගෙන තිබූ මුළු මුදල වූ රු.55,076,250 ක් හා ඊට අමතරව රු.6,507,164 ක් අදාළ කොන්ත්‍රාත්කරු වෙත අවස්ථා 05 ක දී නිදහස් කර තිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) වගන්තිය අනුව කිසිම සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකේම සේවය නොකල යුතු වුවද රු.688,113 ක ලිබඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන 02 කදී එකම සාමාජිකයන් පිරිසක් ලංසු විවෘත කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව නියෝජනය කර තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1. (අ) වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18 (ආ) වගන්තිය පරිදි, ලංසු ඇගයීමේදී එකතු කළ අගය මත බදු (VAT) සැලකිල්ලට නොගත යුතු වුවද, අධිකාරිය විසින් සිදුකළ සියළුම ප්‍රසම්පාදනයන් ඇගයීමේදී එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි ලංසුකරුවන් එවන ලද ලංසු මිල ගණන් බදු සහිත අගයටද, එම බදු වෙනුවෙන් ලියාපදිංචි වී නොමැති ලංසුකරුවන් එවන ලද ලංසු මිල ගණන් බදු රහිත අගයටද, ඇගයීමට ලක් කර තිබුණි. මෙම තත්ත්වය මත ප්‍රසම්පාදන කටයුතුවලදී බදු සඳහා ලියාපදිංචි නොවූ ලංසුකරුවන්ට වාසිදායක වන අයුරින් අධිකාරිය කටයුතු කර තිබුණි.

(උ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (ආ) වගන්තිය අනුව ලංසු වැසීමත් සමඟම හැකිතාක් ඉක්මනින් ලංසු විවෘත කිරීම සිදුකළ යුතු අතර ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී ලංසු විවෘත කිරීම සිදු කළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේදී සිදුකළ රු.1,627,640 ක වටිනාකමින් යුතු ප්‍රසම්පාදන 07 ක ලංසු භාර ගැනීම අවසන් කළ දින සිට, දින 03 ත් දින 110 ත් අතර කාලයක් ලංසු විවෘත කිරීමට ගත කර තිබූ අතර ලංසු විවෘත කිරීම ලංසුකරුවන් ඉදිරියේ සිදු කර නොතිබුණි. තවද, මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ලංසු විවෘත කිරීම නියමිත ආකෘති පත්‍රයක වාර්තා කර නොතිබුණි.

(ඌ) අධිකාරිය විසින් වර්ෂ 05 ක කාලයක් සඳහා බදු පදනම මත ආසන 8 ක වෑන් රථ 2 ක් හා ආසන 16 ක වෑන් රථයක් ලබා ගැනීම සඳහා 2017 මාර්තු 23 දින ප්‍රසම්පාදන දැන්වීමක් පළ කර තිබුණ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (ඇ) වගන්තිය ප්‍රකාරව ලංසු කැඳවීමේ අවසන් දිනට පෙරාතුව වූ දිනය දක්වා ලංසු කැඳවීමේ ලේඛන මිලදී ගැනීමට සැපයුම්කරුවන්ට ඉඩදිය යුතුය. එහෙත් ඉහත ප්‍රසම්පාදන දැන්වීමට අනුව ලංසු කැඳවීමේ අවසන් දිනය 2017 අප්‍රේල් 25 වුවද දින 04 කට පෙර එනම් 2017 අප්‍රේල් 21 දින දක්වා පමණක් ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කර තිබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ii) මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.4 වගන්තිය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කිරීමට අදාලව වාර්තාවක් තබා නොගැනීම හේතුවෙන් කොපමණ ලංසුකරුවන් ප්‍රමාණයක් ලංසු ලේඛන ලබාගත්තේ ද යන්න විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(iii) ප්‍රසම්පාදන දැන්වීම හා ලංසු ලියවිලි වලට අනුව කුලී පදනම මත ලබාගත යුතු අධිකාරියේ වෑන් රථ අවශ්‍යතාව ආසන 08 ක වෑන් රථ දෙකක් හා ආසන 16 ක වෑන් රථයක් පමණක් වුවද මෙම ප්‍රසම්පාදනය යටතේ ආසන 16 ක වෑන්රථ 03 ක් ලබා ගැනීම විගණනයට පැහැදිලි නොකෙරුණි. මෙම තත්ත්වය මත අධිකාරියට මාසිකව වැඩිපුර ගෙවීමට සිදුවන බදුකුලිය රු.70,000 ක් විය.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

**(අ) තලවකැලේ ලිඳුල නිවාස ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 100 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 84.5 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර ව්‍යාපෘතිය 2013 වර්ෂයේ දී ආරම්භ කර 2014 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.මිලියන 76 ක් ලැබී තිබුණද ප්‍රතිපාදනවලින් සියයට 83 ක් හෙවත් රු.මිලියන 63.07 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර ඉදිකළ යුතු නිවාස ඒකක 100 න් නිවාස ඒකක 54 ක් පමණක් ඉදිකර අවසන් කර තිබුණි. එමෙන්ම වැඩ අවසන් කළ නිවාස වර්ෂ 03 ක පමණ කාලයක් ප්‍රතිලාභීන්ට භාර නොදී වසා දමා තිබීම හේතුවෙන් එම නිවාසවලට විශාල ලෙස හානි සිදුවී තිබුණු අතර ඒවා ප්‍රතිසංස්කරණයට අධිකාරියට නැවත වරක් වියදම් දැරීමට සිදුවන බව ස්ථානීය විගණන පරීක්ෂාවේදී වැඩිදුරටත් අනාවරණය විය. තවද, නිවාස ව්‍යාපෘතියට අයත්වන ඉඩමේ අයිතිය මෙම වාර්තාවේ දින වන විටත් අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය මගින් පුනස්ථාපන පදනම මත නිවාස ඒකක 60 ක් ලබාදීමට සැලසුම් කර තිබුණද නිවාස ඒකක 54 ක් පමණක් ඉදිකර තිබූ බැවින් ප්‍රතිලාභීන් 06 දෙනෙකුට නිවාස ඉදිකර නොතිබූ අතර ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව පුනස්ථාපනය කිරීමට අදාල නොවන බාහිර පුද්ගලයින් 16 දෙනෙකුටද ව්‍යාපෘතිය තුළ නිවාස වෙන්කර ඇති බව වැඩි දුරටත් අනාවරණය විය.

(iii) නිවාස ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු ඉදිරිපත්කළ කාර්ය සාධන බැදුම්කරය 2017 ජනවාරි 16 දිනෙන් අවසන්ව තිබුණ ද කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කර නොතිබුණු අතර 2018 ජුනි වන විටත් කොන්ත්‍රාත් කටයුතු අවසන්ව නොතිබුණි.

(ආ) **හලාවත නිවාස ව්‍යාපෘතිය**

හලාවත නිවාස ව්‍යාපෘතියේ කාණු පද්ධතිය සැකසීමට 2015 වර්ෂයේදි රු.මිලියන 2.86 ක් මහා භාණ්ඩාගාරයෙන් අධිකාරියට ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය ඉටුකර නොතිබුණි. කෙසේ වෙතත් ඉදිකිරීම සඳහා 2017 අප්‍රේල් 19 දින පුවත්පත් දැන්වීමක් මගින් මිල ගණන් කැඳවා තිබුණ ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 අනුව, කොන්ත්‍රාත්තුව සඳහා ලංසුකරුවන් සපුරා තිබිය යුතු සුදුසුකම් හා උපමාන, ලංසු සුරක්ෂණ හා එහි වටිනාකම්, ලංසු වලංගු වියයුතු කාලය, කොන්ත්‍රාත් කාලය වැනි තොරතුරු ලංසු ලියවිලිවල ඇතුළත්ව නොතිබූ නිසා ලද මිල ගණන් ප්‍රතික්ෂේප කර නැවත මිල ගණන් කැඳවීමට අධිකාරිය තීරණය කර තිබුණි. නමුත් 2018 ජුනි 01 දින වන විටත් නැවත මිල ගණන් කැඳවීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි.

### 6.1.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කිරීමට සැළසුම් කළ ව්‍යාපෘති වටිනාකම රු. බිලියන 13.43 ක් වූ, මහනුවර මහයියාව නාගරික නිවාස ව්‍යාපෘතියේ වැඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. සුදුසුකම්ලත් ආයෝජකයකු ව්‍යාපෘතිය සඳහා තෝරා ගැනීමට අධිකාරියට නොහැකි වීම මෙම තත්ත්වයට බලපා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම රු.997,801 ක් විය.

### 6.2 අභ්‍යන්තර විගණනය

-----------------------

අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුර පමණක් අනුමත කර තිබුණු අතර මේ පිළිබඳව පසුගිය විගණකාධිපති වාර්තාවලින්ද පෙන්වාදී තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ද අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත විගණන සැලැස්මෙහි ඇතුළත් විගණන වැඩසටහන්වලින් ඇතැම් ව්‍යාපෘතිවලට අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ වැඩසටහන් හා ස්වශක්ති මානව සංවර්ධන යන වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර අධිකාරියේ කාර්යසාධනය ඇගයීමට අදාල වැඩසටහන්, සැලැස්ම තුළ අන්තර්ගතව නොතිබුණි.

## 6.3 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඇතැම් ආදායම් හා වියදම් විෂයයන් වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කර නොතිබුණ අතර අයවැය ගත වියදම හා සත්‍ය වියදම සැසඳීමේදී සියයට 37 සිට සියයට 568 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ගාල්ල රජ්ගම සහ හොරණ හැගල්ලවත්ත නිවාස ව්‍යාපෘතිවල ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.684,526 ක් වැය කර තිබුණ ද එම වියදම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පිඑෆ්/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය පරිදි ආයතනය විසින් සිය වාර්ෂික වාර්තාව, ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා, 2018 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

අධිකාරියේ කාර්යාල ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු රු.3,891,911 ක් නිරවුල් කිරීමකින් තොරව අධිකාරියේ ආදායමට බැර කර තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) වත්කම් හා වගකීම් නිවැරදිව වර්ගීකරණය කර නොතිබීම.<br>(ii) වත්කම්වල පිරිවැය හා ක්ෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| (ආ) මූල්‍ය කළමනාකරණය | (i) අදාල කාර්යය නිමවූ වහාම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම.<br>(ii) විවිධ වැඩසටහන් සඳහා ලැබුණු රාජ්‍ය ප්‍රදාන එම අරමුණෙන් පරිබාහිර කටයුතු සඳහා භාවිතා කිරීම හා රාජ්‍ය ප්‍රදාන වලින් වියදම් නොකරන ලද ශේෂය භාණ්ඩාගාරයට නැවත ප්‍රේෂණය කර නොතිබීම. |

| | |
|---|---|
| | (iii) ණය ගිවිසුම් ප්‍රකාරව ණය වාරික අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හා ණය අයකර ගැනීමේ ප්‍රගතිය පහල අගයක පැවතීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩුව පවතින අධිකාරියේ තනතුරු සඳහා බඳවාගැනීමට කටයුතු නොකිරීම, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදුකර තිබීම හා ඇතැම් තනතුරු නිවැරදිව ශ්‍රේණිගත කර නොතිබීම. |
| (ඇ) ප්‍රසම්පාදනය | (i) එක් එක් ප්‍රසම්පාදනයන් වෙනුවෙන් වෙනම ලිපිගොනු පවත්වාගෙන යාම වෙනුවට එක් වත්කම් කාණ්ඩයකට අදාළ සියළුම ප්‍රසම්පාදනයන් එකම ගොනුවක් තුළ පවත්වාගෙන යාම හේතුවෙන් ප්‍රසම්පාදනයන් වෙන් වෙන් වශයෙන් හදුනාගැනීමට නොහැකි වීම. |
| | (ii) ප්‍රසම්පාදන අංශයේ මැදිහත් වීමකින් තොරව ප්‍රසම්පදාන සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීම. |
| (ඉ) වාහන ලේඛන පවත්වාගෙන යාම | (i) වාහන ලොග් පොත්වල ගමන් පිළිබඳ මාසික සාරාංශයක් ඇතුළත් නොකිරීම. |
| | (ii) මාසිකව රජයේ වාහන සඳහා භාවිතා කළ ඉන්ධන ප්‍රමාණය, ධාවනය කළ කිලෝ මීටර් ගණන, මාසය තුළ කළ අළුත්වැඩියාවන් යනාදිය ඇතුළත් කොට ප්‍රවාහන සේවා සටහනක් සකස්කර නොතිබීම. |